

# ආලෝක පූජා

## ඔබගේ විහාරස්ථානයේ මෙන්ම ජාතික විදුලි බල ගැටලුව සමනය කිරීමට ඔබටත් දායක විය හැකිය

**දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ආගමික ආයතනවල කාර්යභාරය**

**ආගමික ආයතන සූර්යකරණය සඳහා නියමු ව්‍යාපෘතියක්**

සෑම ආගමික ආයතනයක්ම හරිත ක්ෂේම භූමියක් බවට පත්කිරීමේ සංකල්පය අනුගමනය කරමින්, දේශගුණික විපර්යාස පිටුදකින විරුවන්ගේ භූමිකාව ආගමික ආයතන භාරගැනීමේ අදහස සංකල්පගත කළ අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා ආගමික ආයතනවලට පියස මත සූර්ය පද්ධති ලබා දීම උචිත බව හඳුනාගෙන ඇත.
මෙම විප්ලවය දියත් කළ හැකි හොඳම ක්‍රමය වන්නේ අධික විදුලි බිල පිළිබඳ ගැටලුව සමගාමීව විසඳා ගැනීමේ වාසියයි. හරිත ක්ෂේම භූමියක්වූ අවසාන ඉලක්කය කරා වන අනෙකුත් මැදිහත්වීම් මෙම මුලපිරීම මගින් බෙහෙවින් පහසු වනු ඇත.

**අප සැමගේම සහයෙන් මෙම ආලෝක පූජාව සාර්ථකව දියත් කර ආගමික මෙන්ම ජාතික මෙහෙවරක් ඉටු කිරීමට අගනා අවස්ථාවක් එළඹ ඇත.**

මෙම සංකල්පය 2022 නොවැම්බර් 30 වන දින බුද්ධශාසන අමාත්‍යාංශයේ සහ තිරසාර සංවර්ධන සභාවේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජිතයන් සමඟ ජනාධිපති උපදේශක රුවන් විජේවර්ධන මහතා සමඟ සාකච්ඡා කරන ලදී. ආගමික ආයතන සඳහා වූ සූර්ය බල පද්ධති යනු "ජන කේන්ද්‍රීය හරිත ආගමික ආයතන" යන මූලික සංකල්පයට සමගාමී, ආර්ථික හා පාරිසරික යන දෙඅංශයෙන්ම ආකර්ශණීය යෝජනාවකි.
මෙම මුල පිරීම ප්‍රායෝගිකව බද්ධ කර අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගත හැකි වන පරිදි අවශ්‍ය මූල්‍ය, තාක්ෂණික සහ පරිපාලන යෙදවුම් හඳුනාගෙන විවිධ ආගම් සිද්ධස්ථාන වලින් සමන්විත ආගමික ආයතන 1000 ක් ආවරණය වන පරිදි නියමු ව්‍යාපෘතියක් දියත්

කිරීමට තීරණය කරන ලදී. බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසින් එවැනි ආයතන 1000 ක කණ්ඩායමක් සංයුතිය හා තෝරා ගැනීම සඳහා නිර්ණායක යෝජනා කරන අතර, ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය යෝජනා ඇතුළුව ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය සහ ක්‍රියාකාරිව සංවර්ධනය කිරීමට සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය විසින් භාර ගන්නා ලදී.

**<u>මෙම සටහන නියමු ව්‍යාපෘතියේ යෝජිත ව්‍යුහය සහ ප්‍රධාන අංග ආවරණය කරයි.</u>**

**පූජනීය ස්ථාන සඳහා වත්මන් මාසික විදුලි බිල**

| | මාසික පරිභෝජනය | විදුලි ඒකකයක මිල | ස්ථාවර ගාස්තු | මාසික විදුලි බිල | ආයතන ගනන |
|---|---|---|---|---|---|
| **0-30** | 30 | **8** | **90** | 330 | |
| 31-90 | 60 | 15 | 120 | 810 | |
| 91-120 | 120 | 20 | 120 | 2010 | 32100 |
| 121-180 | 180 | 30 | 450 | 4140 | |
| >180 | 200 | 32 | 1500 | 5830 | |
| | 400 | 32 | 1500 | 12230 | 7930 |
| | 550 | 32 | 1500 | 17030 | |
| | 650 | 32 | 1500 | 20230 | |
| | 880 | 32 | 1500 | 27590 | 1500 |
| | 1100 | 32 | 1500 | 34630 | 550 |

**වැඩි බහුතරයක් ආයතන මසකට එකක 180 අඩුවෙන් භාවිත කරන නමුදු , පසුගිය දින ඇතිවූ මිල වැඩිකිරීමෙන් විශාල බලපෑමක් ඇතිවූයේ ඊට වඩා වැඩි භාවිතයක් ඇති පූජනිය ස්ථාන වලටය. එමෙන්ම හඳුන්වා දෙන ක්‍රමවේදයේ සාර්ථකත්වය තහවුරු කිරීම පිණිස සැළකිය යුතු මට්ටමක බැංකු ණය පහසුකම් ලබාගැනීමේ පරමාර්ථයෙන් , ව්‍යාපෘතියේ ආරම්භයක් ලෙස මසකට ඒකක 200 ට ඉහළ භාවිතයක් ඇති ආයතන ඉලක්ක කර ගත් ක්‍රමවේදයක් යෝජනා කර ඇත.**

**ඒ හා සමගාමීව මසකට ඒකක 90 සිට 180 දක්වා භාවිත ආයතන සඳහා වෙනත් ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.**

1. ආයතන 1000 යනු මසකට විදුලි ඒකක 200 ට වැඩි පරිභෝජන කණ්ඩායමට අයත් ඒවා විය යුතුය.
2. එක් එක් ව්‍යාපෘති ඒකකයේ තිරසාරභාවය සඳහා කිසියම් ප්‍රාග්ධන සහනාධාරයක් අවශ්‍ය බව පිළිගැනේ.
3. විදුලි ඒකක 180 සිට ඒකක 400 දක්වා පරිභෝජන කණ්ඩායම සඳහා 50% සහ ඒකක 500 සිට ඒකක 880 සහ ඊට වැඩි පරිභෝජනයක් ඇති ආයතන සඳහා 30% දක්වා සහනාධාරයක් යෝජනා කර ඇත.
4. ඉතිරිය ණය අරමුදල් ලෙස, තෝරාගත් බැංකු විසින් 15% ක සහනදායි පොලි අනුපාතයකට ලබා ගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. (මෙම ව්‍යාපෘතිය යටතේ නියමු ව්‍යාපෘතිය හා ආරම්භක අදියර ලෙස පන්සල් 10 ක් සඳහා පද්ධති සවි කෙරෙන අතර දෙවන අදියර සඳහා පන්සල් 100 ක සවි කිරීමට ඇති සැළසුම අදාළ සමාගම් වෙත දැනුම්දීම. )

5. තෝරාගත් එක් එක් ආයතනයේ පරිභෝජන මට්ටම සහ සෙවන නොවන වහල අවකාශයේ වර්ගඵලය වැනි භෞතික පරාමිතීන් සමඟ ගැලපෙන පරිදි, අදාළ ආයතනයට අවශ්‍ය තාක්ෂණික පිරිවිතර සකස් කිරීමට බෞද්ධ සම්මේලනය විසින් තාක්ෂණික සහ පරිපාලන සහාය ලබා දිය හැකිය.
6. සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කලින් තීරණය කළ නිර්ණායක මත, පහසුව සඳහා කෙටි ලැයිස්තුගත කර ඇති සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි සේවා සපයන්නන්ගෙන් විනිවිද පෙනෙන ආකාරයෙන් ටෙන්ඩර් කැඳවීම සඳහා එවැනි එක් එක් ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහ වාණිජ පිරිවිතර සකස් කළ යුතුය.
7. අවශ්‍ය පරිදි ණය අරමුදල් ඉල්ලුම් කිරීමට උපදෙස් සහ ලියකියවිලි සඳහා උපකාර කිරීමට සම්මේලනය විසින් එක් එක් ආගමික ආයතනයට සහාය විය හැකිය .
8. පද්ධති ස්ථාපනය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සම්මේලනය විසින් නියාමනය , එක්ස්රෝ පහසුකම හා තාක්ෂණික අධීක්ෂණය ලබා දෙනු ඇත.
9. සම්මේලනය විසින් ලබාදෙන එවැනි සේවාවන්හි පිරිවැය ආවරණය කිරීම සඳහා පිරිවැය අයකර ගැනීම මත පදනම් වූ ගාස්තුවක් අය කරනු ලැබේ. මෙය ප්‍රාග්ධන වියදමේ සුළු කොටසක් ලෙස සැලකිය හැකිය.
10. නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී උගත හැකි පාඩම්, හඳුනාගත් අනෙකුත් ආගමික ආයතන ආවරණය වන පරිදි පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා බෙදාගනු ලැබේ.
11. ආරම්භයක් ලෙස අවම තරමින් ඉහත නිර්නායකයනට සරිලන බෞද්ධ සිද්ධස්ථාන 10 ක් හඳුනාගෙන මෙම ව්‍යාපෘතිය වහාම දියත් කිරීම සුදුසු යැයි තාක්ෂණික කමිටුව යෝජනා කර ඇත. එමගින් රට මුහුණ පා ඇති අතිශය දරුණු විදුලි අර්බුදයට එකම කෙටිකාලින විසඳුම වන පියස මත සූර්ය බල කට්ටල සවිකිරීමට ජනතාව යොමු කිරීමට ආදර්ශයක් ගමේ විහාරස්ථානය මගින් ලබා දෙනු ඇත.

<u>මූල්‍යමය සලකා බැලීම්</u>

ඉහත සඳහන් කළ පරිදි ව්‍යාපෘතියේ සාර්ථකත්වය රඳා පවතින්නේ ප්‍රාග්ධන සහනාධාරය සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමේ සාර්ථකත්වය මතය.

ආයතන 1000ක ලැයිස්තුව තෝරා ගත් පසු, ඒ ඒ දායක සභාවන් හෝ ඔවුන්ගේ විහාරස්ථානයක් සඳහා ආධාර සැපයීමට කැමති විදේශිකයන් ඇතුළු තමන් කැමති ආයතනය භාර ගන්නා පරිත්‍යාගශීලීන් සෙවීම සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

එක් එක් කාණ්ඩයේ ආයතන සංඛ්‍යාවේ උපකල්පිත තේරීමක් මත පදනම්ව මූළ ප්‍රාග්ධන වියදම් පිළිබඳ දළ තක්සේරුව පහත දැක්වේ. ආයතන 1000 ලැයිස්තුව තීරණය කළ පසු මෙය අවශ්‍ය පරිදි යාවත්කාලීන කළ හැකිය.

ආයතන සංඛ්‍යාව - 1000

පද්ධතියක ධාරිතාව - කිලෝ වොට් 5-12 දක්වා
සමස්ත ප්‍රාග්ධනය - රුපියල් මිලියන 3,260
සහනාධාර ප්‍රමාණය - රුපියල් මිලියන 1,200

සමස්තයක් ලෙස ආයතන 1000 ක් සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය බිලියන ගණනක් වුවද , එක් එක් විහාරස්ථානය සඳහා අවශ්‍ය සහනාධාරය දළ වශයෙන් රුපියල් 1,000,000 ක් පමණය.

එමෙන්ම එක් එක් ස්ථාපනයන්හි ධාරිතාව ප්‍රමාණවත් ලෙස වැඩි කිරීම සහ සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය අනුව ශුද්ධ ගිණුම්කරණ විකල්පය (net accounting ) තෝරාගැනීම මගින් මාසික විදුලි බිල ඉතිරි කිරීමට අමතරව, ණය ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් විහාරස්ථානවලට ලැබෙනු ඇත. බැංකුවලට තවදුරටත් ආරක්ෂාව සැලසීම සඳහා, ලංවිම කළ යුතු ගෙවීම් බැංකුවේ ගනුදෙනුකරුගේ ගිණුමකට සිදු කරන බවට වග බලා ගැනීමට කටයුතු කළ හැකි අතර, එවිට ණය වාරිකය අයකර ගැනීමට හැකිවන පරිදි, අරමුදල් ආපසු ගැනීමට පන්සලට අවසර දීමට පෙර සියලුම ආදායම මත බැංකුවට අයිතියක් (lien) ඇති කළ හැකිය. ණය ගෙවා අවසන් වූ පසු පන්සලට ලැබෙන ආදායම සැලකිය යුතු ලෙස වැඩි වනු ඇත.

**<u>පහත විශ්ලේෂණය මෙම යෝජනා ක්‍රමයේ ශක්‍යතාව පෙන්නුම් කරයි</u>**

| සූර්ය පද්ධතියේ ධාරිතාව | ප්‍රාග්ධන මිල රු. | සහනාධාර % | ඉතිරි මුදල රු. | මාසික ජනනය kWh | අතිරික්තය kWh | ඒකකයට රු. 37 බැගින් ආදායම | මාසික ණය වාරිකය | ආයතනයට මසකට ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 8 | 2,800,000 | 50.00% | 1,400,000 | 880 | 680 | 25,160 | 16,755.36 | 30,990 |
| 10 | 2,750,000 | 50.00% | 1,925,000 | 1,100 | 700 | 25,900 | 23,038.62 | 38,130 |
| 10 | 2,750,000 | 30.00% | 1,925,000 | 1,100 | 550 | 20,350 | 23,038.62 | 37,380 |
| 12 | 3300000 | 30.00% | 2,310,000 | 1,320 | 670 | 24,790 | 27,652.33 | 45,020 |
| 16 | 4400000 | 30.00% | 3,080,000 | 1,760 | 880 | 32,560 | 36,861.8 | 60,150 |
| 20 | 5000000 | 30.00% | 3,500,000 | 2,200 | 1,100 | 40,700 | 41,888.4 | 75,330 |

යෝජිත ප්‍රාග්ධන සහනාධාර මට්ටම සහ "සූර්ය බලසංග්‍රාමය" යටතේ ඒකකයකට රුපියල් 37.00 ක ශුද්ධ ගිණුම්කරණ ක්‍රමය සඳහා දැනට පවතින විදුලි පාරිභෝගික අය ක්‍රමය මත, විහාරස්ථානවලට පහසුවෙන් ණය ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගත හැකි බව පෙනේ. මේ සඳහා විහාරස්ථානයේ කිසිදු මූල්‍යමය ප්‍රාග්ධන දායකත්වයක් අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ප්‍රාග්ධන සහනාධාර පිටතින් ලබා ගැනීමේ හැකියාව අඩු නම් හෝ ණය ආපසු ගෙවීම සඳහා බැංකුවලට අඩු කාලයක් අවශ්‍ය නම්, යම් පමණක දායකත්වයක් අවශ්‍ය වනු ඇත.

ප්‍රාග්ධන සහනාධාරය මත පමණක් සහ කිසිදු ප්‍රාග්ධන දායකත්වයකින් තොරව ණය ආපසු ගෙවීමට විහාරස්ථානයට හැකිවීම සඳහා, පරිභෝජනය දැනට පවතින අගයට වඩා ඉහළ යාමට ඉඩ නොතැබිය යුතු අතර එය තවදුරටත් පහත හෙළීමට සංරක්ෂණ

ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. එමගින් බැංකු ගිණුමේ අතිරික්ත අරමුදල් එකතුවනු ඇත.
එබැවින් මෙය ජාතික අවශ්‍යතාවයක් වන බලශක්ති සංරක්ෂණයට දිරිගැන්වීමක් වනු ඇති අතර විහාරස්ථාන පෙරමුණ ගෙන දායකයින්ට අනුකරණය කිරීමට ආදර්ශයක්ද විය හැකිය. මෙම වගකීම ආයතනය විසින්ම කැමැත්තෙන්ම පිළිගැනීම වඩාත් වැදගත්ය.

කෙසේ වෙතත් මාසික බිල්පත් බරින් මිදීම හේතුවෙන් අධි පරිභෝජනයට තුඩු දෙන අයථා පරිහරණය පිළිබඳ යම් සාක්ෂි තිබේ නම්, එය වැළැක්වීමට තාක්ෂණික ආරක්ෂණයන්ද කල හැකි ය.
සමහර විට තෝරාගත් ආයතන ප්‍රාග්ධන සහනාධාරය ලැබීම සඳහා පූර්ව සුදුසුකමක් ලෙස එවැනි කැපවීම ප්‍රදර්ශනය කිරීමට සහ මාස කිහිපයක අඩු පරිභෝජනය ප්‍රදර්ශනය කිරීමට ඉලක්කගත ආයතන යොමු කල හැකිය.
මෙම අභ්‍යාසයේ මූලික මූලධර්මය වන්නේ හරිත සංකල්ප භාවිතා කරමින් දේශගුණික විපර්යාස අවම කිරීම මිස ආගමික ආයතනවලට විදුලිය සඳහා වන පිරිවැය අඩු කිරීම පමණක් නොවේ. ශුද්ධ ගිණුම්කරණය (Net Accounting)මත පදනම් වූ ඉහත යෝජනාව මාසික විදුලි බිලෙහි බරෙන් මිදීමේ අරමුණ ඉටු කරනු ඇත. නමුත් පුනර්ජනනීය බලශක්ති කළඹට එකතු කිරීමෙන් දේශගුණික විපර්යාස තවදුරටත් අවම කර ගත හැකි හරිත බලශක්ති අතිරික්තයක් ජාතික ජාලය තුළ උත්පාදනය කිරීමට ඇති අවස්ථාව මෙන්ම ජාතික බලශක්ති අර්බුදය සමනය කිරීමටද දායක වනු ඇත.
මෙම පදනම මත සකස් කරන ලද ව්‍යාපෘති විෂය පථය පහත දැක්වේ.

| ආයතන පරිභෝජනය විදුලි ඒකක | ආයතන ගණන | සහනාධාර % | ඒකක ධාරිතාව කිලෝ වොට් | මුළු සහනාධාර ප්‍රමාණය රු. මිලියන | මුළු ප්‍රාග්ධන නය රු. මිලියන | මුළු ජනනය විදුලි ඒකක kWh | කාබන් විමෝචන ඉතිරිය කිලෝ ග්‍රෑම් | ස්ථාපිත පූර්ණ ධාරිතාව කිලෝ වොට් |
|---|---|---|---|---|---|---|---|---|
| 200 | 200 | 50 | 8 | 280 | 280 | 480,000 | 336,000 | 1,600 |
| 400 | 200 | 50 | 10 | 275 | 275 | 960,000 | 672,000 | 2,000 |
| 550 | 200 | 30 | 10 | 165 | 385 | 1,320,000 | 924,000 | 2,000 |
| 650 | 200 | 30 | 12 | 198 | 462 | 1,560,000 | 1,092,000 | 2,400 |
| 880 | 100 | 30 | 16 | 132 | 308 | 1,056,000 | 739,000 | 1,600 |
| 1100 | 100 | 30 | 20 | 150 | 350 | 1,320,000 | 924,000 | 2,000 |
| Total | 1000 | | | 1,200 | 2,060 | 6,696,000 | 4,687,200 | 11,600 |

**මෙම පද්ධති 1000 තුලින් පමණක් ලැබෙන වැදගත් අතිරේක වාසි වනුයේ :**

1. **ජාතික විදුලි පද්ධතියේ ජනන අවශ්‍යතාව මෙගා වොට් 11 කින් අඩුවීම.**
2. **තෙල් ආනයන අවශ්‍යතාව වසරකට ලීටර 1,6674,000 කින් අඩු වීම.**

**3.** විදේශ විනිමය ඉතිරිය වසරකට ඩොලර් **1,439,600**

**4.** වි.බ.මණ්ඩලයට වාසිය වසරකට රු. **140,760,000**

**වයාපෘති ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණ උපාය මාර්ග**

විහාරස්ථාන සඳහා සූර්යබල පද්ධති ලබාදීමේ සංකල්පය ආරම්භ කළ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, අන්‍ය ආගමික නිකායන් නියෝජනය කරන එවැනි අනෙකුත් සංවිධානවල සහයෝගයෙන් ඒ සඳහා නායකත්වය ගැනීමට කැමැත්තෙන් සිටී.

හඳුනාගත් කාර්යභාරයන් සහ වගකීම් සහිත එවැනි සියලුම නියෝජනයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට යෝජනා කෙරේ. මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති සම්මේලනයේ උපදේශණ අංශය හරහා එවැනි සහය අපේක්ෂා කරන අනෙකුත් සියලුම සංගම් වෙත සිය තාක්ෂණික සහාය ලබා දීමට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය කැමැත්තෙන් සිටී.

**වයාපෘතියේ කාල සීමාව**

එක් එක ආයතනයට පමණක් නොව විදුලි බල මණ්ඩලයට මෙන්ම රටටද අත්වන ප්‍රතිලාභ සැළකිල්ලට ගනිමින් මෙම වයාපෘති 1000 මාස 12ක කාලයක් තුළ අවසන් කිරීමට යෝජනා කෙරේ.

මෙම සත්කාර්යය කඩිනමින් දියත් කර ජාතික සහ ආගමික මෙහෙවරක් කිරීමට ඉදිරිපත් වන ලෙස ඔබට කරන ආරාධනයයි මේ. අඩු භාවිතය සහිත ආයතන සඳහා වන ක්‍රමවේදය මෙම ප්‍රථම උත්සාහයේ සාර්ථකත්වය ගැනද සලකා ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

ඔබගේ දායකත්වය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මල්කාන්ති රණවක මෙනවිය වෙත නොපමාව දන්වන්න.

දුරකථන - 011 2665047/070 498 6686
whats app - 070 498 6686
විද්‍යුත් තැපැල - buddhistinfo380@gmail.com

චන්ද්‍ර නිමල් වාකිෂ්ට
ගරු සභාපති .
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
2022 දෙසැම්බර් 12

සංකල්ප පත්‍රිකාව සකස් කරන ලද්දේ :

01. ඉංජී.පරාක්‍රම ජයසිංහ.

02. ඉංජී.මහින්ද තෙන්නකෝන්.